අහෝ දෙවියනි! නැගෙනහිර හා බටහිර අතර ඔබ දුරස් කළාක් මෙන් මා අතර හා මගේ පාපකම් අතර දුරස් කරනු මැනව

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සලාතයේදී තක්බීර් පැවසූ විට කුර්ආනය සද්ගායනය කිරීමට පෙර මද වේලාවක් නිහඬ ව සිටියි. එවිට මම, “අල්ලාහ්ගේ දූතයාණනි! මාගේ මව හා මාගේ පියා ඔබට කැප කරමි. (සලාතයේ) තක්බීරය හා කුර්ආන් සද්ගායනාව අතර ඔබේ නිහඬතාවයෙන් ඔබ අදහස් කරනුයේ කුමක් ද? ඔබ එහි කියවනුයේ කුමක් ද?" යැයි විමසා සිටියෙමි . එවිට එතුමා ‘මම මෙසේ පවසමි.’ اللهُمَّ بَاعِدْ بَيْنِي وَبَيْنَ خَطَايَايَ كَمَا بَاعَدْتَ بَيْنَ الْمَشْرِقِ وَالْمَغْرِبِ، اللهُمَّ نَقِّنِي مِنْ خَطَايَايَ كَمَا يُنَقَّى الثَّوْبُ الْأَبْيَضُ مِنَ الدَّنَسِ، اللهُمَّ اغْسِلْنِي مِنْ خَطَايَايَ بِالثَّلْجِ وَالْمَاءِ وَالْبَرَدِ "අහෝ දෙවියනි! නැගෙනහිර හා බටහිර අතර ඔබ දුරස් කළාක් මෙන් මා අතර හා මගේ පාපකම් අතර දුරස් කරනු මැනව. අහෝ දෙවියනි! සුදු වස්ත්‍රය කිලිටෙන් පිරිසිදු කරනු ලබන්නාක් මෙන් මාගේ පාපයන් පිරිසිදු කරනු මැනව ! අහෝ දෙවියනි! මාගේ වැරදි ජලයෙන්, පිනි දියෙන් හා සීත ජලයෙන් සෝදා හරිනු මැනව !" යැයි පැවසුහ.

[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සලාතය සඳහා තක්බීර් පැවසූ විට සූරා අල් -ෆාතිහා පාරායනය කිරීමට පෙර සුළු වේළාවක් නිහඬ ව සිටියහ. එහිදී ඇතැම් ප්‍රාර්ථනාවන් සමග එතුමාණෝ තම සලාතය ආරම්භ කළහ. එසේ වාර්තා වී ඇති ප්‍රාර්ථනා අතරින් මෙය එක් ප්‍රාර්ථනාවකි. اللهم بَاعِدْ بَيْنِي وَبَيْنَ خَطَايَايَ كَمَا بَاعَدْتَ بَيْنَ الْمَشْرِقِ وَالْمَغْرِبِ ، اللهم نقِّني مِنْ خَطَايَايَ كَمَا يُنَقَّى الثَّوْبُ الْأَبْيَضُ مِنْ الدَّنَسِ ، اللهم اِغْسِلْنِي مِنْ خَطَايَايَ بِالْمَاءِ وَالثَّلْجِ وَالْبَرَدِ තේරුම : යා අල්ලාහ්! නැගෙනහිර හා බටහිර අතර ඔබ දුරස් කළාක් මෙන් මා හා මාගේ පාපයන් අතර දුරස් කරනු මැනව! යා අල්ලාහ්! සුදු වස්ත්‍රයක කිලිටි පිරිසිදු කරනු ලබනවාක් මෙන් මාගේ පාපයන්ගෙන් මා පිරිසිදු කරනු මැනව! ජලය, පිනි කැට හා හිම තුළින් මාගේ පාපයන්ගෙන් මා සෝදා හරිනු මැනව! එය, නැගෙනහිර හා බටහිර කවදත් හමු නොවන සේ වෙන්ව පවතින්නාක් මෙන් තමන් අතර හා තම පාපයන් අතර එහි තමන් නොවැටෙන සේ ඒ සමග එකිනෙක හමු නොවන සේ දුරසක් ඇති කරන මෙන් ද, එසේ එහි වැටුනේ නම් සුදු වස්ත්‍රයකින් කිළිටි ඉවත් කරන්නාක් මෙන් එය ඉවත් කර පිරිසිදු කරන මෙන් ද, ඔහුගේ වැරදිවලින් ඔහුව සෝදා එහි උණුසුම හා එහි රශ්මිය ජලය, පිණි දිය, හා සීතල වතුර වැනි සිසිල් පිරිසිදු දෙයින් සිසිල් කරන මෙන් ද කෙරෙන ඉල්ලීමකි.

http://www.sunnah.global/hadeeth/si/show/3104